# මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
# நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
# MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01.
ශ්‍රී ලංකාව

செயலகம், கொழும்பு 01.
இலங்கை.

The Secretariat, Colombo 01.
Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700

ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823

වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: PFD/RED/REG/CIR/2023/10

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2024.05.31

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක: 01/2020 (III)

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
පළාත් පාලන ආයතන ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය බැංකු, විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල
ප්‍රධානීන් හා රජය සතු සමාගම්වල සභාපතිවරුන්

**<u>1992 මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන සංශෝධනය කිරීම සඳහා නිකුත් කර ඇති රාජ්‍ය මුදල් හා භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ සංගෘහිත කර පරිශීලනයට පහසු ආකාරයට එක් චක්‍රලේඛයක් නිකුත් කිරීම</u>**

රාජ්‍ය ආයතන විසින් සේවා සම්පාදනය සඳහා අයකරනු ලබන ගාස්තු සංශෝධනය හා නව ගාස්තු අය කිරීම පිළිබඳ විධිවිධාන 2020.08.28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි II කොටසේ 05 ඡේදය මගින් හඳුන්වා දී ඇති අතර 2022.12.20 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 (ii) මගින් තවදුරටත් 2023 වර්ෂය සඳහා ද රාජ්‍ය ආයතන විසින් සපයන සේවාවන් වෙනුවෙන් අය කරන ගාස්තු සංශෝධනයට අවශ්‍ය විධිවිධාන සලසන ලදී.

02. කෙසේ වුව ද, රාජ්‍ය ආයතන විසින් මහජනයා වෙත සපයනු ලබන සේවාවන් වෙනුවෙන් අදාළ අවම පිරිවැය පිළිබිඹු වන ගාස්තු රාමුවක් පවත්වාගෙන යා හැකිවන පරිදි එකී විධිවිධාන තවදුරටත් පහත සඳහන් පරිදි සංශෝධනය කෙරෙන අතර 2022.12.20 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 (ii) හි විධිවිධාන මෙම චක්‍රලේඛය මගින් අවලංගු කෙරේ. ඒ අනුව 2020.08.28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි II කොටසේ 05 ඡේදය වෙනුවට පහත විධිවිධාන ආදේශ කෙරේ.

<u>"5. රාජ්‍ය ආයතන විසින් මහජනයා වෙත සේවා සම්පාදනය කිරීමේ දී අයකරනු ලබන ගාස්තු සංශෝධනය</u>

5.1. පාර්ලිමේන්තුවේ සම්මත කර ඇති පනතක් හෝ වෙනත් යම් නීතියකින් ගාස්තු නියම කිරීම, අය කිරීම හෝ සංශෝධනය කිරීම පිළිබඳව විධිවිධාන සලස්වා ඇති ආයතනවලට එම පනත/නීතිය මගින් නියම කර ඇති ආකාරයට යෝජිත ගාස්තු සංශෝධනය කිරීමට කටයුතු කළ හැකි ය. නියම

කරන ලද නව ගාස්තු හා ගාස්තු සංශෝධනයන් පිළිබඳව මහා භාණ්ඩාගාරය (රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව) වෙත දැනුම් දීම සඳහා මාර්ගෝපදේශ අංක 10හි වගු අංක 5.1 හා 5.2 අදාළ පරිදි භාවිත කළ යුතු ය.

5.2. (අ) ඉහත 5.1 පරිදි පාර්ලිමේන්තුවේ සම්මත කර ඇති පනතක් හෝ වෙනත් යම් නීතියකින් විධිවිධාන සලස්වා නොමැති අවස්ථාවන්හි දි, රාජ්‍ය ආයතන විසින් මහජනයා වෙත සේවා සම්පාදනය කිරීමේ දී අයකරනු ලබන ගාස්තු වසර තුනකට වරක් සමාලෝචනය කළ යුතු ය.

(ආ) එම සමාලෝචනයෙන් පසුව ගාස්තු සංශෝධනයක් කිරීමට රාජ්‍ය ආයතනයකට අවශ්‍ය වේ නම්, වසර තුනකට නොඅඩු හා වසර හතරකට නොවැඩි කාලසීමාවක් තුළ දී 15%ක උපරිම ප්‍රතිශතයකට යටත්ව අදාළ ගාස්තු ඉහළ නැංවීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට බලය දෙනු ලැබේ. මෙම ගාස්තු සංශෝධනයන් පිළිබඳව මහා භාණ්ඩාගාරය (රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව) වෙත දැනුම් දීම සඳහා මාර්ගෝපදේශ අංක 10හි වගු අංක 5.1 භාවිත කළ යුතු ය.

(ඇ) ඉහත 5.2 (අ) හි පරිදි ගාස්තු සමාලෝචනය කිරීමෙන් පසුව, ගාස්තු සංශෝධනය කිරීමක් සිදු කිරීම අවශ්‍ය නොවන බවට ආදායම් ගණන් දීමේ නිලධාරියා විසින් තීරණය කරන අවස්ථාවල දී ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා මගින් ඒ සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට දැනුම් දිය යුතු ය.

5.3. කෙසේ වුව ද, 5.4 ඡේදයෙහි විශේෂයෙන් සඳහන් කර ඇති ආකාරයට හැර පහත සඳහන් එක් එක් අවස්ථාවන්හි දී ගාස්තු සංශෝධනයක් සිදු කිරීමට අවශ්‍ය බවට රාජ්‍ය ආයතන විසින් තීරණය කරන්නේ නම් එම සංශෝධනයන් යෝජනා කිරීමට හේතු වූ කරුණු ද සමග ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ නිර්දේශය සහිතව භාණ්ඩාගාරයේ ලේකම්ගේ /භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ගේ අනුමැතිය සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට යොමු කළ යුතු ය. මෙම ගාස්තු සංශෝධන සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීම සඳහා මාර්ගෝපදේශ අංක 10 හි වගු අංක 5.3 භාවිත කළ යුතු ය.

(අ) වර්තමාන ගාස්තු වසර තුනක් ගතවීමට පෙර නැවත සංශෝධනය කිරීම හෝ

(ආ) වර්තමාන ගාස්තු වසර තුනකට වරක් වුව ද 15%ට වඩා වැඩි ප්‍රතිශතයකින් සංශෝධනය කිරීම

5.4. සපයනු ලබන සේවාවන් වෙනුවෙන් අයකරනු ලබන ගාස්තු සංශෝධනය ඉහත 5.3 හි කුමන කාණ්ඩයකට අයත් වුව ද එකී සංශෝධිත නව ගාස්තුව රු. 1,000/- නොඉක්මවන අවස්ථාවල දී ඉහත 5.2 හි සඳහන් වසර තුනක කාල සීමාව සහ 15% ප්‍රතිශත සීමාව නොසලකා අවම පිරිවැය ආවරණය වන ගාස්තු රාමුවක් පිළිඹිබු වන පරිදි ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය මත එම ගාස්තු සංශෝධනය කළ හැකි ය.

5.5. නව ගාස්තු හඳුන්වා දීම සඳහා කිසියම් නීතියකින් විධිවිධාන සලස්වා නොමැති රජයේ ආයතන විසින් යම් නව ගාස්තුවක් හඳුන්වා දෙන්නේ නම් එම ආයතන විසින් තම අමාත්‍යාංශය මගින් ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු ය. මෙම ගාස්තු සංශෝධනයන් පිළිබඳව මහා භාණ්ඩාගාරය (රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව) වෙත දැනුම් දීම සඳහා මාර්ගෝපදේශ අංක 10හි වගු අංක 5.2 භාවිත කළ යුතු ය.

5.6. රජයේ ආයතන විසින් මහජනතාව වෙත සේවා සම්පාදනය කිරීමට අදාළව නව ගාස්තුවක් හඳුන්වාදෙන හෝ ගාස්තු සංශෝධනයක් සිදු කරනු ලබන අවස්ථාවල දී විෂයානුබද්ධ දැනුම ඇති නිලධාරින්ගෙන් සමන්විත කමිටුවක් මගින් අදාළ ගාස්තු සමාලෝචනය කිරීමට කටයුතු කළ යුතු ය.

5.7. රජයේ ආයතන විසින් ඉහත 5.1 සිට 5.5 දක්වා ඇති කවර හෝ විධිවිධානයක් යටතේ වුව ද මහජනතාව වෙත සේවා සම්පාදනය කිරීමට අදාළව නව ගාස්තුවක් හඳුන්වාදෙන හෝ ගාස්තු සංශෝධනයක් සිදු කරනු ලබන ඕනෑම අවස්ථාවක එම ගාස්තු ගැසට් පත්‍රයේ පළ කිරීම තුළින් මහජනතාවගේ දැනගැනීම සඳහා ප්‍රසිද්ධියට පත් කළ යුතු ය.

5.8. (අ) හඳුන්වාදෙන ලද නව ගාස්තු හා සංශෝධනය කරන ලද ගාස්තු පිළිබඳව, එම සංශෝධන ගැසට් පත්‍රයේ පළ කරන ලද දින සිට දින 14ක් ඇතුළත ඉහත 5.1, 5.2, 5.4 හා 5.5 ඡේදවල සඳහන් පරිදි රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත (dgpf@pfd.treasury.gov.lk දරන විද්‍යුත් තැපැල් ලිපිනයට) දැනුම් දිය යුතු ය.

(ආ) ගාස්තු සංශෝධනය සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීම හා ගාස්තු සංශෝධන මහා භාණ්ඩාගාරය වෙත දැනුම්දීමට, සංශෝධිත මාර්ගෝපදේශ අංක 10 හි ඇතුළත් නියමිත ආකෘති භාවිත කළ යුතු අතර එම මාර්ගෝපදේශය රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙන් බාගත කරගත හැකි ය".

03. මෙම චක්‍රලේඛය පිළිබඳව තවදුරටත් පැහැදිලි කිරීමක් අවශ්‍ය වන්නේ නම් දුරකථන අංක 011-2 034 508 මගින් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ හෝ 011- 2 484 631 මගින් රාජ්‍ය මුදල් සහකාර අධ්‍යක්ෂ ඇමතිය හැකි ය.

**ඒ. කේ. සෙනෙවිරත්න**
භාණ්ඩාගාරයේ ලේකම් (වැ.බ.)

පිටපත්: 01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. අමාත්‍ය මණ්ඩල ලේකම්
04. විගණකාධිපති

සංශෝධිත මාර්ගෝපදේශ අංක 10
රා.මු.ච. 01/2020(III)

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020(III) යටතේ

රාජ්‍ය ආයතන විසින් මහජනයා වෙත සේවා සම්පාදනය කිරීමේ දී නව ගාස්තු හඳුන්වාදීම හා වර්තමාන ගාස්තු සංශෝධනය සම්බන්ධ තොරතුරු දැනුම් දීම / ගාස්තු සංශෝධනය කිරීමට මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීම සඳහා වන ආකෘති පත්‍රය

1. කැබිනට් අමාත්‍යාංශය/ රාජ්‍ය අමාත්‍යාංශය:

2. දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම:

3. ගාස්තු අයකිරීමේ අධිකාරය:

   (ගාස්තු අයකිරීමට අධිකාරය ලැබී ඇත්තේ පාර්ලිමේන්තුවේ සම්මත වූ පනතකින් ද, ගැසට් පත්‍රයකින් ද, නැතහොත් වෙනත් යම් අනුමැතියක් අනුව ද යන්න සඳහන් කළ යුතු අතර එහි පිටපතක් ඉදිරිපත් කළ යුතුය)

4. ගාස්තු සංශෝධනයට අනුමැතිය ලබාගැනීම/නව ගාස්තු හඳුන්වා දීම හෝ ගාස්තු සංශෝධනය දැනුම්දීමට අදාළ යොමුව :

   (රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 (III) හි උප ඡේද 5.1 /5.2 /5.3 ආදී වශයෙන්)

5. පොදු උපදෙස්

   (i). රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 (III) හි උප ඡේද 5.2 (ආ) හා 5.4 විධිවිධාන යටතේ රාජ්‍ය ආයතන විසින් ගාස්තු සංශෝධන සිදු කිරීමෙන් අනතුරුව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත තොරතුරු ලබාදීම සඳහා පමණක් 5.1 වගුව භාවිතා කළ යුතු ය.

   (ii). රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 (III) හි උප ඡේද 5.1 හා 5.5 හි විධිවිධාන පරිදි නව ගාස්තු හඳුන්වාදීමෙන් පසුව ඒ පිළිබඳ තොරතුරු රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම සඳහා පමණක් 5.2 වගුව භාවිතා කළ යුතු ය.

   (iii). රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 (III) හි 5.3 උප ඡේදයේ විධිවිධාන අනුව ගාස්තු සංශෝධනය සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය අපේක්ෂා කෙරේ නම් ඒ සඳහා අදාළ තොරතුරු 5.3 වගුව මගින් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතු ය.

6. රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 (ii) හි 5.3 උප ඡේදය යටතේ නිකුත් කර ඇති මාර්ගෝපදේශ අංක 10 රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020(III) යටතේ නිකුත් කෙරෙන මෙම මාර්ගෝපදේශය මගින් අවලංගු කෙරේ.

ජ.ඒ. රත්නසිරි
රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

## 5.1. රාජ්‍ය ආයතන මට්ටමෙන් ගාස්තු සංශෝධනය කිරීම

රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 (III) හි උප ඡේද 5.2 (ආ) හා 5.4 හි විධිවිධාන යටතේ රාජ්‍ය ආයතන විසින් ගාස්තු සංශෝධනයක් සිදු කිරීමෙන් අනතුරුව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත තොරතුරු ලබාදීම සඳහා පමණක් මෙම වගුව භාවිතා කළ යුතු ය.

| I | II | III | IV | V | VI |
|---|---|---|---|---|---|
| අනු අංකය | සපයනු ලබන්නා වූ සේවය | අවසන්වරට ගාස්තු සංශෝධනය කරන ලද වර්ෂය | පැවති ගාස්තුව (රු.) | නව ගාස්තුව (රු.) | ආදායම ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලබන ආදායම් ශීර්ෂය* |
| | | | | | |

*ඒකාබද්ධ අරමුදල හැර වෙනත් අරමුදලකට ගාස්තු බැර කෙරේ නම් ඒ පිළිබඳ විස්තර ද (අරමුදලේ නම හා බැර කරනු ලබන ප්‍රතිශතය) සඳහන් කළ යුතු ය.

## 5.2 නව ගාස්තු හඳුන්වාදීම

රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 (III) හි උප ඡේද 5.1 හා 5.5 හි විධිවිධාන පරිදි නව ගාස්තු හඳුන්වාදීමෙන් පසුව ඒ පිළිබඳ තොරතුරු රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම සඳහා පමණක් පමණක් මෙම වගුව භාවිතා කළ යුතු ය.

| I | II | III | IV |
|---|---|---|---|
| අනු අංකය | සපයනු ලබන්නා වූ සේවය | යෝජිත ගාස්තුව (රු.) | ආදායම ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලබන ආදායම් ශීර්ෂය* |
| | | | |

නව ගාස්තුවක්/ ගාස්තු හඳුන්වාදීමට හේතු හා එම ගාස්තුව තීරණය කරන ලද පදනම එක් එක් අනු අංකය යටතේ සඳහන් කළ යුතු ය.

*ඒකාබද්ධ අරමුදල හැර වෙනත් අරමුදලකට ගාස්තු බැර කෙරේ නම් ඒ පිළිබඳ විස්තර ද (අරමුදලේ නම හා බැර කරනු ලබන ප්‍රතිශතය) සඳහන් කළ යුතු ය.

පී.ඒ. රත්නසිල
රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

**5.3. ගාස්තු සංශෝධනය සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීම**

රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 (III) හි උප ඡේද 5.3 හි විධිවිධාන අනුව ගාස්තු සංශෝධනය සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීම අපේක්ෂා කෙරේ නම් ඒ සඳහා අවශ්‍ය තොරතුරු පහත වගුව මගින් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතු ය.

| I | II | III | IV | V | | | VI | | VII |
|---|---|---|---|---|---|---|---|---|---|
| අනු අංකය | සපයනු ලබන්නා වූ සේවය | අවසන් වරට ගාස්තු සංශෝධනය කරන ලද වර්ෂය | අවසන් වරට සංශෝධිත ගාස්තුව (රු.) | නියම කර තිබූ ගාස්තුව අනුව පසුගිය වර්ෂ තුන තුළ අය කළ මුළු ආදායම (රු.) | | | යෝජිත නව ගාස්තුව | | ආදායම ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලබන ආදායම් ශීර්ෂය* |
| | | | | 202.. | 202.. | 202.. | රුපියල් | ප්‍රතිශතය | |
| | | | | | | | | | |

ගාස්තු සංශෝධනය සඳහා හේතු එක් එක් අනු අංකය යටතේ වගුවේ නව තීරුවක හෝ වෙන් වෙන් වශයෙන් ඇමුණුමක් ලෙස සඳහන් කළ යුතු ය.

* ඒකාබද්ධ අරමුදල හැර වෙනත් අරමුදලකට ගාස්තු බැර කෙරේ නම් ඒ පිළිබඳ විස්තර ද (අරමුදලේ නම හා බැර කරනු ලබන ප්‍රතිශතය) සඳහන් කළ යුතු ය.

පී.ඒ. රත්නසිල
රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.